# කතෘගෙන්

නගරයේ සිට ගම්බද පෙදෙස් දක්වා මේ දිනවල ඉමහත් ආන්දෝලනයක් ඇතිරී ඇති වියලි මිරිස් නිෂ්පාදනය කෙරෙහි පාඨකයාගේ අවධානය යොමු කරවනු කැමැත්තෙමු.

පෝෂ්‍ය පදාර්ථයන්ගෙන් පොහොසත් නොවුවත් ආහාර පිළියෙල කර ගැනීම සඳහා අත්‍යාවශ්‍ය වූ වියලි මිරිස් සඳහා අතිරේක ආහාර බෝග අතුරින් මුල් තැනක් හිමිවී ඇති බැව් අමුතුවෙන් සඳහන් කිරීම අවශ්‍ය නොවේ. වියලි මිරිස් නිෂ්පාදනය සඳහා ප්‍රයෝජනවත් කරුණු රැසක් ඇතුලත් පින්තූර කතාවක්ද මෙවර ගොවිකම් සඟරාවේ පලවේ.

මෙරට වැසියාගේ අවශ්‍යතාවයන් සපුරාලීම සඳහා අඩු වශයෙන් වියලි මිරිස් හොණ්ඩර 3,36,000 ක් වත් අවශ්‍යවේ. මෙම ප්‍රමාණය ජනතාව අතර බේදා හැරීමට ආනයනය කළ මිරිස් සඳහා විදේශ විනිමය සෑහෙන ප්‍රමාණයකින් වැය කිරීමට සිදුවිය. 1967 දී රුපියල් 2,93,32,132 ක් වටිනා වියළි මිරිස් හොණ්ඩර 2,90,172 ක් ද 1968 දී රුපියල් 3,41,55,953 ක් වටිනා හොණ්ඩර 3,51,787 ක්ද, 1969 දී රුපියල් 2,50,00,000ක් මිලවූ හොණ්ඩර 2,46,000 ක්ද ආනයනය කළ අතර, 1970 දී එම ප්‍රමාණය හොණ්ඩර 80,000 දක්වා අඩු වූයේය. මීට හේතුවූයේ දේශීය නිෂ්පාදනයේ ප්‍රගතියයි. 1966-67 තුළ හොණ්ඩර 36,447 ක්ද 1967-68 තුළ හොණ්ඩර 75,318 ක්ද 1968-69 තුළ හොණ්ඩර 1,32,730 ක්ද නිපදවූ අතර වර්තමාන නිෂ්පාදනය හොණ්ඩර 1,50,000 ක් පමණ දක්වා වැඩිවී ඇත.

සාර්ථකව වියලි මිරිස් නිපදවන වියලි කලාපයේ වාරිමාර්ග සහිත වගාවක අක්කරය කින් හොණ්ඩර 6-20 ක් බලාපොරොත්තු විය හැකිය. එහෙත් නිෂ්පාදනය කෙරෙහි බලපාන හේතු කීපයක් නිසා තෙත් කලාපයේ ව්‍යාපාරික තත්වයෙන් වගා කිරීම සීමාවී ඇත. මේ නිසා දනට මිරිස් නිපදවන වියලි කලාපයේ අක්කර 33,200 ක් පමණ වූ හේන් ඉඩම් වලට අමතරව තවත් ඉඩම් මේ සඳහා යෙදවීමත් එම ඉඩම් වල ගොවීන් පදිංචි කරවීමත් කෙරෙහි රජයේ අවධානය ප්‍රධාන වශයෙන් යොමුවී ඇත.

වියලි මිරිස් වලින් මෙරට ස්වයංපෝෂිත කිරීමෙහි ලා යෝජිත වගා ඉලක්කයන් දෙයාකාරයකින් දක්විය හැක. එහි මුල් පියවර වනුයේ කෙටිකාලීන සැලැස්මක් ක්‍රියාත්මක කිරීමයි. ඒ යටතේ දනට නිපදවන හොණ්ඩර 1,50,000 ක් පමණ වූ ප්‍රමාණය සහතික මිළ ක්‍රමයේ යටතේ රජය මගින් මිලදී ගැනීමට කටයුතු යොදගෙන යනු ලැබේ. පුළුල් වශයෙන් වගා කිරීමේ පහසුකම් නොමැති පළාත්වල ක්‍රියාත්මක කිරීමට බලාපොරොත්තුවන ගෙවතු වගා ක්‍රමයෙන් හොණ්ඩර 50,000 ක් පමණ නිපද වීමට අදහස් කෙරේ. දනට කෙරෙන වගාවන්හි දියුණු ගොවිතැන් ක්‍රම අනුගමනය කර එමගින් හොණ්ඩර 53,040 ක වැඩි අස්වැන්නක් බලාපොරොත්තු වේ. වාරිමාර්ග පහසුකම් සහිතව විශේෂ ව්‍යාපාරයන්හි වගා කිරීමෙන් හොණ්ඩර 8,000 ක් නිපදවීමට අදහස් කරනු ලැබේ. මෙම වැඩ පිළිවෙල අනුව වාර්ෂික නිෂ්පාදනය වියලි මිරිස් හොණ්ඩර 2,61,040 දක්වා වැඩිකර එම ප්‍රමාණය දිවයින පුරා බෙදා හැරීමට රජයට හැකි වෙනවා ඇත. දීර්ඝකාලීන වැඩ සැලැස්ම යටතේ සාර්ථකව මිරිස් වගාකළ හැකි පෙදෙස්හි තව අක්කර 19,000 ක වාරිමාර්ග පහසුකම් සලස්වා වගාකර එමගින් හොණ්ඩර 1,90,000 ක් නිපදවීමට බලාපොරොත්තු වේ. මෙම ඉලක්කයන් මුදුන් පමුණුවා ගැනීමට හැකි වූවොත් මෙරට අවශ්‍යතාවය ඉක්මවනු ඇත. මේ නිසා මෙම වැඩ සැලැස්ම ක්‍රියාත්මක කිරීමේ දී රජයෙන් ඉටුවන සේවාවන් හා මහජනයාගෙන් ලැබිය යුතු සහයෝගයත් මඳක් විමසා බලමු.

මිරිස් නිෂ්පාදනයේදී පැන නඟින සියලු ප්‍රශ්නයන් විසඳීමට රජය දිරි දරයි. ගොවිකම් දෙපාර්තමේන්තුව මගින් මේ පිළිබඳ පර්යේෂණ රැසක් පවත්වා ඇත. ඒ අනුව සොයාගෙන ඇති වර්ග අතුරින් "මහ ඉලුප්පල්ලම දෙමුහුන්" වර්ගය ඉතා සුදුසුයයි නිර්දේශ කර ඇත. ක්‍රමවත් වගාවක මූලාරම්භය වූ හොඳ වර්ගයකින් උපරිම අස්වැන්නක් ලබාගැනීම සඳහා නවීන ගොවිතැන් ක්‍රම උපයෝගිකර ගැනීම අවශ්‍ය කරුණකි. නිර්දේශිත රසායනික පොර භාවිතා කිරීම, ජල සම්පාදනය, කෘමි හා රෝග මර්දනය හා වල් මර්දනය ගැන වගාවේ පටන් ගැනීමේ සිට සැළකිලිමත් විය යුතුවේ. නිෂ්පාදනය සම්පූර්ණ වන්නේ නිසි අවස්ථාවේදී අස්වනු නෙලා හොඳින් වේලා ගබඩා කිරීමෙන් පසුවය.

මිරිස් නිෂ්පාදනය සඳහා අවශ්‍ය විද්‍යාත්මක උපදෙස් ගොවිකම් දෙපාර්තමේන්තුව මගින් සපයනු ලැබේ. වගා කිරීමේදී ගොවියාට මුහුණ දීමට වන ප්‍රශ්ණ නිරාකරණය කර ඔහු උනන්දු කරවනු වස් ක්‍රියාත්මක වන යෝජනා ක්‍රම කීපයක් ගැන නැවත හඳුන්වා දෙනු කැමැත්තෙමු. ගොවියාගේ මූලික අවශ්‍යතාවය වන කෙටිකාලීන ණය පහසුකම් විවිධ සේවා සමුපකාර සමිති මගින් ලබාගැනීමේ අවස්ථාව සලසා ඇත. ඒ අනුව වර්ෂා ජලයෙන් වගා කෙරෙන අක්කරයකට රුපියල් 125 ක්ද වාරි ජලයෙන් වගා කෙරෙන අක්කර කාලකට රුපියල් 200 ක්ද ලබාගත හැකිය. ගොවියාගේ ඊළඟ අවශ්‍යතාවය වනුයේ නිෂ්පාදනය අලෙවි කිරීමයි. මේ සඳහා ක්‍රියාත්මක වන සහතික මිල ක්‍රමය යටතේ දැනට වියලි මිරිස් හොණ්ඩරයකට රුපියල් 392 ක මිලක් ලබාගත හැකිවේ. වාරි ජල සම්පාදනයෙන් වගා කරන අක්කරයක් සඳහා රුපියල් 2,100 ක පමණ වියදමක් වැය වන අතර, මෙවැනි වගාවකින් අපේක්ෂිත අඩුම අස්වැන්න වන හොණ්ඩර 10 ක් අලෙවියෙන් රුපියල් 1,820 ක පමණ ශුද්ධ ලාභයක් බලාපොරොත්තු විය හැකි ය.

වගාවේ ආරම්භයේ සිට නිෂ්පාදන අලෙවිය දක්වා අවශ්‍ය හැම ආධාරයක්ම දීමට රජය ඉදිරිපත් වී සිටී. ඒවායින් නිසි ප්‍රයෝජන ගෙන උපරිම අස්වැන්නක් ලබා ගැනුම ගොවියාගේ යුතුකමකි. අපගේ විදේශ විනිමය රැකගැනුම කෙරෙහිත්—මහ ජනයාගේ අවශ්‍යතාවය සපුරා ලීම කෙරෙහිත් වැදගත් තැනක් ගන්නා වියලි මිරිස් නිෂ්පාදනයෙන් මෙරට ස්වයංපෝෂිත කිරීමට හැම දිරියක්ම දරනු ඇතැයි අපේ ගොවිජනතාවගෙන් උදක් බලාපොරොත්තු වෙමු.

## "සිසු ගොවි පැන"

කෘෂිකර්මය විෂයයක් වශයෙන් හදරන ශිෂ්‍යයින්ගේත් විශේෂයෙන් අ.පො.ස. (සා.පෙ.) විභාගයට පෙනී සිටින්නන් ගේත් දැනුම දියුණු කර ගැනීමෙහි ලා ඉතාමත් ප්‍රයෝජනවත් වූ "සිසු ගොවි පැන" තීරයක් මෙම සඟරාවට ලබන කලාපයේ සිට ඇතුලත් වෙයි.

ගොවිතැනට අදළ ඔබගේ ඕනෑම ප්‍රශ්නයක් ඇතොත් එය අප වෙත ලියා එවන්න. කවරයේ වම්පස උඩ කෙළවරේ "සිසු ගොවි පැන" යනුවෙන් සඳහන් කරන්න. ප්‍රශ්න එවිය යුත්තේ අදළ කූපනයද සමගය.

අධ්‍යාපන අමාත්‍යාංශයේ කෘෂිකර්ම අංශය විසින් සපයන පිළිතුරු ඊළඟ කලාපයේ පළවනු ඇත.